

# භාවනාව ලොකු සටනක්

මම ලොකු හාමුදුරුවන්ගේ කුටියට ගියෙමි. උන්වහන්සේ සිටියේ සීලිම දෙසට දෑස යොමු කරමිනි.

මකුළුවෙක් දැල වියා රැක සිටී. කුඩා මැස්සෙක් කවුළුවෙන් කුටියට ඇතුළු වෙයි. ඌ එහාට පියාඹයි, මෙයාට පියාඹයි, මැස්සා සිටින්නේ සතුටින් නටමිනි. ඌට දුකක්, විපතක් නො පෙනේ, නොදැනේ. ඌ ලොකු හාමුදුරුවන්ගේ හිසට ඉහළින් පියඹා ගියේ, මකුළු දැලෙහි බැඳිණි. කුඩා පිහාටු වේගයෙන් සැලිණි. දැලෙන් මිදීමට ඌ ගත් වෑයම යි ඒ. මොහොතකින් මකුළුවා මැස්සාට ළං වේ. ඌ ඉවරයි ඌ මැස්සා යුෂ බවට පත් ව මකුළු කුසට පිවිසේ.

ලොකු හාමුදුරුවන්ගේ මුවගින් ලෝවැඩ සඟරාව මතු විය.

"කුමට නැටුම් කෙළි කවට සිනා දා මරුට නොමැත කිසි විටකදි බාදා.." මා දොරකඩ සිටිනු උන් වහන්සේට පෙනිණි.

"පොඩිනම දැක්ක ද දැන් සිදු වුණ දේ?"
"එහෙමයි, මා බලාගෙන සිටියා... ලෝවැඩ සඟරාවේ කවි දෙපදයත් අසාගෙන සිටියා"

"දැක්ක නේ.. මැස්සා නටාගෙන ආවේ.. ඌ දන්නේ නැහැ උගේ මාරයා දැලක් දාගෙන ඉන්නවා. මැස්සා පමණක් නො වෙයි. ලෝක සත්ත්වයා ම උවදුර දකින්නේ නැහැ. මාරයා අත ළඟ බව සිතන්නේ නැහැ."

උන් වහන්සේගේ හඬ නැවතිණි. මුහුණ මඳක් අඳුරු විය. අප්‍රාණික අත මඳක් සෙලවිණි. යළි නිසල විය.

මම "ලොකු හාමුදුරුවනේ..." යි කීවෙමි.
"නෑ.. නෑ.. මං මේ." ලොකු හාමුදුරුවෝ තැතනූ හ.

"පැන් ටිකක් ගේන්න ද?"

"එපා පොඩි නම. මට මා ගැන සිහි වුණා. මටත් මරණය ළඟ යි. මාරයා අත වනනවා. හෙට-අනිද්දාට මා යනවා. මරණයට පෙර රැස් කළ යුතු දේ මා රැස් කරලා නැහැ වගේ" "පොඩිනම, මම හැමදාමත් පොඩිනමට කියනවා. මා පන්සල් හැදුවා, රට පුරා ම ගිහින් බණ කිව්වා, පිරිකර එකතු කළා... එපමණ-කයි. සංසාර ගමන තවත් දිග්ගැස්සෙන වැඩ මිස සසර ගමන නතර කරන දේට මට ඉඩ ලැබුණේ නැහැ. මා පව් කළ කෙනෙක් නම් නො වෙයි. හොඳට ධර්මය
ප්‍රචාරය කළා. ඒත් ඒ ධර්මය අනුව, බුදු රජාණන් වහන්සේ පෙන්වූ ධර්ම මාර්ගයේ ගමන් කළේ නැහැ. ධර්ම මාර්ගය ලෙස මා දක්වන්නේ මේ භවයේ දී ම නිවන් දැකීම සඳහා ධර්මය ජීවිතයට සම්බන්ධ කර ගැනීම යි. දැන් මට ඊට වෙලාවක් නැහැ.

'පණ්ඩුපලා
සෝවචානිසි - යම පුරිසාපි ච තං
උපට්ඨිතා
උයෙය්ගමුඛේ ච තිට්ඨසි - පාටෙයයම්පි
ච තේ නවිජ්ජති'
'ඔබ දැන් පඬු පැහැ ගත්, ඉදුණු කොළයක් වගෙයි.
යම දූතයන් ඔබ කැඳවාගෙන යාමට ඇවිල්ලා. නික්මීමේ දොරටුවට නුඹ ළං වෙලා.
එහෙත් නුඹට පරලොව ගෙන යෑමට වියදම් නැහැ.'
"ධම්මපදයේ මලවග්ගයේ ඔය ගාථාව මට මතක් වෙනවා."

"ලොකු හාමුදුරුවන්ට පරලෝ ගෙන යන්ට වියදම් තියෙනවා. කොයි තරම් පින් කළ කෙනෙක් ද?" මම කීවෙමි. උන් වහන්සේ සිනා සුණහ.

"පොඩි නමගේ කතාව හරි. ඒත් ඔය පින්කම්වලින් සිදු වන්නේ යළි ඉපදීම. මා මරණයෙන් පසු දෙව්ලොවට යාවි. එහෙත් දීර්ඝ කාලයකට පසු මා සමහර විට සතර අපායෙක් එකකට වැටේවි, පෙර කළ යම් පවක් නිසා. මේ භවයේ දී අඩු ගණනේ සෝවාන් ඵලය වත් ලැබුණා නම් සතර අපා දුකෙන් වැළකෙනවා. මා ඒ සඳහා වෑයමක් කළේ නැහැ. තරුණ කාලෙත් මට ඕක මතක් වුණා තමයි. එහෙත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. හැම දා ම මම කළ යුතු වැදගත් ම දේ කල් දැම්මා.

දැන් කල් දාන්න මට කාලයක් නැහැ.

නික්මීමේ දොර ළඟයි මා ඉන්නේ"
"ඔබ වහන්සේ මරණ සති භාවනාව වඩන්නට පටන් ගත්තා නේ..."

"ඔව්. පොඩිනම නේ මට ඒක වඩන්නය කීවේ. එහෙත් මට දැනෙනවා ඒක මදි බව. මරණසති භාවනාව කොච්චර කළත් සිත නොසන්නුන්. කමක් නැහැ.

මම දැන් පොඩි උන්නාන්සෙ ගැනයි හිතන්නේ. දැන් කොහොම ද භාවනාව"
"අවසර යි, මම තාම භාවනාවට සූදානම් වෙනවා.."

"පංචස්කන්ධය, ධාතු හතර, ත්‍රිලක්ෂණය පිළිබඳ ව දැනුම ලබාගන්නවා කීවා නේද?"

"එහෙම යි, මම ඒ තුන ගැන ම සාමාන්‍ය දැනීමක් ලබාගත්තා. දැන් ඉතින් භාවනාව පටන් ගන්න ඕන"

"භාවනාව පටන් ගැනීමට පෙර භාවනාවට සිදු විය හැකි බාධා පිළිබඳවත්, ඒ බාධා වළක්වන ආකාරය පිළිබඳවත් දැනගෙන සිටීම හොඳයි. ඒ බාධා 'පංච නීවරණ' නමින් හැඳින්වෙනවා. පොඩි නම ඒ ගැනත් දන්නවාද?"

"නැහැ"

"කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාර නීවරණය, ථින මිද්ධ නීවරණය, උද්ධච්ච කුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය වශයෙන් නීවරණ පහ යි. ඒවා හඳුනාගන්න. භාවනාවට මේ නීවරණ බාධා කරනවා. ඒවා ජය ගන්නා හැටි බුදු හාමුදුරුවන් පැහැදිලි කොට තිබෙනවා"

"හොඳමයි - මා ඒවාත් කියවන්නම්.."

"භාවනාව ලොකු සටනක් කියල හිතාගන්න ඕන. සටනට යනකොට ආයුධ ඕනෑ. භාවනාවට බාධා එල්ල කරන දේවල් ජය ගැනීමටත් ඒ සඳහා ක්‍රම දැනගන්න ඕන. මම ධර්ම දේශනාවල දී භාවනා උපදෙස් දීලා තිබෙනවා. ඒත් භාවනා කළේ නැහැ"

උන් වහන්සේගේ මුහුණ යළි අඳුරු විය.

මම උන් වහන්සේට නමස්කාර කොට, කුටියෙන් පිටතට ආවෙමි.

නීවරණ පිළිබඳ ව තොරතුරු රැස් කිරීම පටන් ගතිමි.

